“කවරෙකු දිවුරා සිටිමින්, තම දිවුරුමෙහි 'අල් ලාත් හා අල් උස්සා (කාෆිර්වරු නමදින පිළිම) මත දිවුරා සිටිමි' යැයි පවසන්නේ ද, ඔහු ‘ලා ඉලාහ ඉල්ලල්ලාහු යනුවෙන් පවසත්වා!‘ කවරෙකු තම මිතුරාට, ‘එන්න, මම ඔබ සමග ඔට්ටු අල්ලමි‘ යැයි පවසන්නේද, ඔහු සදකාවක් කරත්වා!“

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “කවරෙකු දිවුරා සිටිමින්, තම දිවුරුමෙහි 'අල් ලාත් හා අල් උස්සා (කාෆිර්වරු නමදින පිළිම) මත දිවුරා සිටිමි' යැයි පවසන්නේ ද, ඔහු ‘ලා ඉලාහ ඉල්ලල්ලාහු යනුවෙන් පවසත්වා!‘ කවරෙකු තම මිතුරාට, ‘එන්න, මම
ඔබ සමග ඔට්ටු අල්ලමි‘ යැයි පවසන්නේද, ඔහු සදකාවක් කරත්වා!“
[صحيح] [متفق عليه]

අල්ලාහ් නොවන දෑ මත දිවුරා සිටීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අවවාද කළහ. දේවත්වය විශ්වාස කරන මුඃමින්වරයා අල්ලාහ් මත හැර වෙනත් කිසිවක මත දිවුරා නොසිටින පරිදිය. සැබැවින්ම කවරෙකු අල්ලාහ් හැර වෙනත් දෙයක් මත දිවුරා සිටියේ ද, ඔහු 'ලාත්' හා 'උස්සා' මත දිවුරා සිටින්නෙකු මෙනි. ඒ දෙක ඉස්ලාමයට පෙර අඥාන යුගයේ වන්දනාමානයට ලක් වූ පිළිම දෙකකි. එවිට තමන් තුළ 'ලා ඉලාහ ඉල්ලල්ලාහු' යැයි පවසා සිටිය යුතු ය. එය ඔහුව එම ෂිර්ක් භාවයෙන් ඉවත් කරන අතර එලෙස කළ දිවුරුමට එය ප්රතිකර්මයක් වේ. "එනු අපි ඔට්ටු අල්ලා සෙල්ලම් කරමු (සූදු කෙළිමු)" යැයි පවසා සිටින්නා ගැන ද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියහ. එනම් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු තමන් අතර ජයග්රහණය ලබන තැනැත්තා මුදල් ලබා ගැනීමේ පදනම මත ජය ලබන්නට තරඟ වැදීමය. ඔවුන් සෑම කෙනෙකුම එය කෙසේ හෝ උදා කර ගැනීමට හෝ ඒ සඳහා ගෙවීමට හෝ ඔහු උත්සාහයේ යෙදීමෙන් මිදෙන්නේ නැත. එවිට ඔහු යමක් සදකාවක් ලෙස පරිත්යාග කළ යුතු වේ. තමන් කවර කරුණක් වෙත ඇරයුම් කර සිටියේ ද එයට ප්රතිකර්මයක් බවට මෙය පත්වනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/6379